# කර්මාන්ත අමාත්‍යාංශය

# පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්

# පුරප්පාඩු

පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ් වනාහි පූර්ණ වශයෙන් රජයට අයත්, ලාභ උපදවන හා ස්වයංව යැපෙන, ශ්‍රී ලංකාවේ රසායන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ හා අලෙවි කිරීමේ නියැලී සංවිධානයක් හෙවත් ආයතනයකි. පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා සුදුසු හා යෝග්‍යතා සපිරි අයවළුන් වෙතින් එම තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

## තාක්ෂණ නිලධාරී (JM-1-1) - තනතුරු 01

**තනතුරේ වගකීම් :**

නිෂ්පාදන භාණ්ඩ සංවර්ධනය කිරීම, පර්යේෂණ සංවර්ධන කටයුතු තත්ත්ව පරීක්ෂණ, සිදුකිරීම් ගුණාත්මක වීම වැඩි දියුණු කිරීම්, නිපැයුම්වල ගුණාත්මක තත්ත්වය සහතික කිරීම.

**සුදුසුකම් :**

**බාහිර අපේක්ෂකයින් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C.) විසින් පිළිගනු ලබන රසායන විද්‍යාව ඇතුළුව, විද්‍යා විෂය ධාරාවෙන්, විද්‍යාවේදී (B.Sc.) උපාධියක්

**අභ්‍යන්තර අපේක්ෂකයින් :**

ඉහත සඳහන් බාහිර අපේක්ෂකයින් හටද අදාළ හා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

**වයස් සීමාව :**

වයස අවුරුදු 22 ට නොඅඩු විය යුතු වන අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින් හට බලනොපානු ඇත.)

**වැටුප් පරිමාණය :**

JM 1-1 රු. 42,600-10X755-18X1,135-70,580/- (වාර්ෂිකව)

**මූලික වැටුප :**

රුපියල් 42,600/- සහ ජීවන වියදම් දීමනාව, රු. 7,800/-

## වැඩ මූලික තනතුර : (ma 2-2) - තනතුරු 01

වැඩබිමේ ඉංජිනේරුවරුන්ගේ අධීක්ෂණය යටතේ, ක්ලෝරීන් සිලින්ඩර් නඩත්තුව අධීක්ෂණය කිරීම, ක්ලෝරීන් නැවත පිරවීම අධීක්ෂණය කිරීම හා ක්ලෝරීන් හා වෙනත් නිෂ්පාදන, නිපදවීම හා බෙදාහැරීම අධීක්ෂණය, වැඩබිමේ ඉංජිනේරුවරුන්ගේ අධීක්ෂණය යටතේ, සිදු කිරීම.

**සුදුසුකම් :**

**බාහිර අපේක්ෂකයින් :**

අදාළ ක්ෂේත්‍රයේ (විදුලි, යාන්ත්‍රික, ගලපා සකස් කිරීම් යනාදිය වැනි) ක්ෂේත්‍රවල, තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තාක්ෂණික/ කාර්මික වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කරන ලද, ජාතික වෘත්තීය කුසලතා 5 වන මට්ටමට (NVQ 5) නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**වයස් සීමාව :**

වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතු වන අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින් හට බල නොපානු ඇත.)

**වැටුප් පරිමාණය :** MA 2-2

රුපියල් 30,310-10X300-7X350-4X600-20X710-52,360

**මූලික වැටුප :** රු. 30,310/- සහ ජීවන වියදම් දීමනාව රු. 7,800/-

## කළමනාකරණ සහකාර තනතුර (MA 1-2) - තනතුරු 04

**සුදුසුකම් :**

**බාහිර අපේක්ෂකයින්**

(අ) (i) සිංහල/ දෙමළ (ii) ඉංග්‍රීසි භාෂාව (iii) ගණිතය ඇතුළුව, විෂයන් හතරකට (04) කට සම්මාන සාමාර්ථ සහිතව, එකම වතාවකදී, විෂයයන් (06) හයකින් අ.පො.ස. (සා.පෙ.) විභාගය සමත්වී සිටීම.

(ආ) සාමාන්‍ය පොදු ප්‍රශ්න පත්‍රය හැර, විෂයන් තුනකින් (03) අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත්වී සිටීම.

**අභ්‍යන්තර අපේක්ෂකයින් :**

පහත සඳහන් සුදුසුකම් සහිත, ප්‍රාථමික මට්ටම - පුහුණු සහ ප්‍රාථමික මට්ටම - නුපුහුණු වර්ගීකරණයන්වල සේවකයින් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබනු ඇත.

**අධ්‍යාපනික :**

(i) සිංහල/ දෙමළ (ii) ඉංග්‍රීසි භාෂාව (iii) ගණිතය, ඇතුළුව විෂයයන් හතරකට (04) කට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් හයකින් (06) කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වී සිටීම.

සහ

ඉහත සඳහන් සේවක වර්ගීකරණය යටතේ, ස්ථිර සේවා තනතුරක, අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය :**

MA 1-2-2016 - (රුපි 27,910-10X300-7X350-12X600-12X710-49,080)

**මූලික වැටුප :** රු. 27,910/- සහ ජීවන වියදම් දීමනාව රු. 7,800/-

**වයස් සීමාව :**

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. (මෙම ඉහළ වයස් සීමාව, අභ්‍යන්තර අපේක්ෂකයින් හට බල නොපානු ඇත.)

ඉහත සඳහන් තනතුරු සඳහා වන බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය.

ලිඛිත තරගකාරී විභාගයක් සහ/හෝ පත්කිරීම් බලධරයා විසින් පත්කරනු ලබන, මණ්ඩලයක් මගින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**සෑම අපේක්ෂකයෙකුම**

(i) ශ්‍රී ලාංකීය පුරවැසියෙකු විය යුතුය.

(ii) දිවයිනේ ඕනෑම පළාතක සේවය කිරීමට සුදුසු සහ තනතුරට පැවරෙන, අදාළ රාජකාරී මැනවින් ඉටුකිරීමට හැකිවන කායික හා මානසික සුවතාවයෙන් යා යෝග්‍යතාවයෙන් සමන්විත විය යුතුය.

(iii) විශිෂ්ට හා අනර්ඝ චරිතයකින් යුක්ත විය යුතුය.

**වෙනත් ප්‍රතිලාභ :**

මාසික දිරි දීමනාව සහ වාර්ෂික ප්‍රසාද දීමනාව ගෙවනු ලැබේ. ආයතනය විසින්, සෞඛ්‍ය රක්ෂණ ආවරණය සපයනු ලැබේ.

සමාගම විසින් සේවක අර්ථ සාධක අරමුදලට (EPF) දායකත්වය සහ වැටුපෙන් 3% ක් වශයෙන් සේවා නියුක්තයින්ගේ භාර අරමුදලට (ETF) දායකත්වය ලබාදෙනු ලබන අතර, සේවකයා විසින්, සේවක අර්ථසාධක අරමුදලට (EPF) සිය වැටුපෙන් 10% ක් වශයෙන් දායකත්වය සපයනු ලැබේ.

**අයදුම් කිරීමේ ක්‍රියාපටිපාටිය :**

අයදුම්කරුවන් විසින්, සිය සම්පූර්ණ ජීව දත්ත තොරතුරු (Bio-Data) සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපිනද සමග,

සියලු අදාළ අධ්‍යාපනික සුදුසුකම් හා පලපුරුද්ද පිළිබඳ සහතික පත්‍ර වල, පිටපත් ද සමග, 2021-02-12 වන දිනට හෝ ඊට පෙර, පහත ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. අයදුම්කරනු ලබන තනතුර ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව ලියා සටහන් කළ යුතුය.

රජයේ දෙපාර්තමේන්තු/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ රාජ්‍ය සංස්ථා/ පූර්ණව රජයට අයත් සමාගම් ආදියේ සේවයේ නියුතු අයදුම්කරුවන්, සියලු අයදුම්පත් සිය අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් එවිය යුතුය. අසම්පූර්ණ හෝ ප්‍රමාදවී ලැබෙන අයදුම්පත්, භාර ගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ. කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් පමණක්, සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

**සභාපති,**
**පරන්තන් කෙමිකල්ස් කම්පැනි ලිමිටඩ්,**
**100/25, ශ්‍රී රාමනාදන් මාවත,**
**කොළඹ 13.**

**දුරකථන : 0112-324466/0112-437556**